**සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම - 2019**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනෙමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.18,290,062 ක් වූ ස්ථාවර වත්කම් වර්ග 18ක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතිණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වසරේදී වත්කම් සියල්ල ප්‍රත්‍යාගණනය සිදු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කරන බව. | සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පවතිණ වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | කොටගල ප්‍රජාශක්ති කාර්යාලයේ ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කටයුතු සම්බන්ධයෙන් නිලධාරීන් දෙදෙනෙකුට විරුද්ධව පවතින නඩුව පිළිබඳ තොරතුරු සහ 2016 ජුනි 29 | 2020 වර්ෂයේ සිට හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිතය ප්‍රකාරව හෙළිදරව් කිරීම් කළ යුතුය. |

දිනැති අපම/16/1095/739/004 දරන කැබිනට් මණ්ඩල තීරණය අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි සෞම්‍යමූර්ති තොණ්ඩමන් පදනමේ ස්ථිර කාර්ය මණ්ඩලය ඇතුළුව පදනම යටතේ පවතින සියලුම ව්‍යාපෘති, එහි චංචල හා නිශ්චල දේපල, කාර්යයන් හා උපයනු ලබන සියලු ආදායම් අදාල රේඛීය අමාත්‍යාංශට පවරා දීම පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 44 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි වල පිරිවැය වෙන් වෙන්ව ගිණුම් වල හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිලි සඳහා ක්ෂය වෙන් කිරීමේදී එකතුව රු. 277,679,780 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වල මුළු පිරිවැයෙන් සියයට 50 ක් මත සියයට 2 ක් ක්ෂය කිරීම ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය ලෙස ගිණුම්වල හෙළිදරව් කර තිබුණද 2005 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මුළු පිරිවැය වටිනාකම මත එකතුව රු.77,388,249 ක් ක්ෂය සඳහා වෙන් කර තිබීම හේතුවෙන් සමුච්චිත ඌනතාවය රු.35,925,236 ක් හා වර්ෂයේ ඌනතාවය රු.2,776,798 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රත්‍යාගණන කටයුතු 2023 වසරේ සිදුකර නිවැරදි කිරීම් සිදු කරන බව. | නිවැරදි කිරීම් කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ රේඛීය අමාත්‍යාංශයට පදනමේ කටයුතු පවරා ගැනීමෙන් පසු, පදනම විසින් ස්වයං රැකියා ව්‍යාපාර සඳහා 2016 වර්ෂයට පෙර බාහිර පාර්ශවයන්ට ලබා දී තිබූ රු.562,996 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිශ්චිත තීරණයක් ගෙන ගැටළුව නිරාකරණය කරන බව. | ණය අයකර ගැනීම විධිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2016 සිට 2019 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පදනමේ සේවකයන්ට උත්සව අත්තිකාරම් හා අනෙකුත් ණය වශයෙන් රු.1,536,529 ක් ලබාදී තිබුණු අතර සේවක වැටුප් ගෙවීමේදී සේවකයන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු නොකර වෙනත් ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ලංකා කම්කරු කොංග්‍රසයට අයත් කොටගල පිහිටි ගොඩනැගිල්ලක ප්‍රජා ශක්ති ව්‍යාපෘතිය පවත්වාගෙන යනු ලබන කාලය තුලදී පදනම විසින් සිදු කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් දරන ලද වියදම අයකර ගන්නා ලෙස 2012 නොවැම්බර් 07 දින පැවති කෝප් කමිටු රැස්වීමේදී නිර්දේශ කර තිබුණද, 2019 දෙසැම්බර් 31 වන විටත් අයවිය යුතු රු. 2,457,239 ක මුදල තවදුරටත් පදනමට අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මෙම අය කර ගැනීම් සඳහා 2022.08.16 හා 2022.12.06 යන දිනවල සිහි කැඳවීම් යවා තිබුණද පිළිතුරු ලබාදී නොමැති බව. | අයකර ගැනීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය. |
| (ඇ) | ආයතන 06 කට ලබා දී තිබූ එකතු වටිනාකම රු.14,760,076 ක් වූ අත්තිකාරම් වර්ෂ 03 කට වැඩි කාලයක සිට අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2013 පෙබරවාරි සිට ජූලි දක්වා වූ කාලපරිච්ඡේදයට අයත් එකතුව රු.4,205,283 ක් වූ සේවක අර්ථ සාධක අරමුදල් දායකය ගෙවීමට කටයුතු නොකර 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ගෙවිය යුතු ගිණුම්වල දක්වා තිබුණි. | 2023 වසරේ ප්‍රතිපාදන වලින් ගෙවීමට කටයුතු කරන බව. | අත්‍යවශ්‍ය වියදම් සඳහා ප්‍රතිපාදන ලබා ගෙන සේවක අර්ථ සාධක අරමුදල් දායකය ගෙවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | පදනම යටතේ පැවති කොළඹ ශාඛාවේ සහ ව්‍යාපෘති 04 හි දීර්ඝ කාලයක් තුළ ගෙවිය යුතුව පැවති එකතු වටිනාකම රු.605,313 ක් වූ විදුලි බිල්, දුරකථන බිල් සහ ජල බිල් 2019 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | මෙම බිල්පත් රේඛීය අමාත්‍යාංශය මගින් සෘජුවම ගෙවා ඇති බව. | ගෙවා අවසන්ව ඇති අයිතම ගිණුම්වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු.3,497,910 ක් වසර 5 කට වැඩි කාලයක සිට අදාල කොන්ත්‍රාත් ආයතන වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉදිකිරීම් නිම කිරිම සඳහා මුදල් ප්‍රතිපාදන නොමැති වීම මත වැඩ නවතා ඇත. අදාල කොන්ත්‍රාත් ආයතන වෙත ගෙවිය යුතු වටිනාකම් හිලව් කල හැකිද යන තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ලබාගෙන ඉදිරි කටයුතු කරන බව. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට විධිමත් ක්‍රියා මාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ගිණුම් යටතේ, ආයතන 15 කට ගෙවිය යුතු එකතු වටිනාකම රු.8,445,582 ක් වර්ෂ 03 ට වැඩි කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගෙවිය යුතු වටිනාකම් දක්වා ඇති ආයතන බොහොමයක් දැනට ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින අතර ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | නිරවුල් කිරීමට විධිමත් ක්‍රියා මාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කෙටිකාලීන ණය හිමියන් 25 දෙනෙකුට ගෙවිය යුතු එකතු වටිනාකම වූ රු.88,184,387 ක් පැවති අතර එම වටිනාකම තුළ වසර 05 ඉක්මවූ ණයහිමි වටිනාකම රු.85,331,368 ක් විය. | දැනට වසර 07 කට වැඩි කාලයක් ණය හිමියන්ගෙන් විමසීම් සිදුකර නොමැති අතර, ශේෂ සනාථ කිරීම් සඳහාද කිසිදු පිළිතුරක් ලබාදී නොමැත. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | නිරවුල් කිරීමට විධිමත් ක්‍රියා මාර්ග කඩිනමින් ගත යුතුය.. |

## 1.7 නීති,රීති,රෙගුලාසි සහ කලමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසියට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | 134(3) වගන්තිය | අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත යොමුකල යුතු වුවත් පදනම ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කල යුතු බව. |
| (ii) | 371(2)(ඇ) වගන්තිය | අතුරු අග්‍රිමයක්, එය දෙන ලද කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවද ඒ අනුව | මෙම අග්‍රිම ලබාගත් සේවකයන් දැනට ආයතනයේ සේවය නොකරන අතර හැකි | පියවා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් |

| | | | | |
|---|---|---|---|---|
| | | කටයුතු නොකිරීම හේතුවෙන් රු. 1,004,937 ක අත්තිකාරම් 2019 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | ඉක්මනින් මෙය පියවා ගැනීමට කටයුතු කරන බව. | යෙදිය යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 756 හා 757(2) (ආ) | පදනම විසින් භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතුකරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක PED/1 2 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | මුදල් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් පදනම විසින් 2019 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2022 සැප්තැම්බර් 15 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | 2022 වසරේ සිට නියමිත කාලයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන පරිදි නියමිත කාලයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5.3 වගන්තිය | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් වර්ෂයකට 4 ක් පැවැත්විය යුතු වුවත් වර්ෂය තුළදී කිසිදු රැස්වීමක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | 2023 වසරේ සිට විගණන හා කලමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරන බව. | පදනම වෙනුවෙන් කමිටු ස්ථාපිත කර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,303,653 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 8,947,960 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,644,307 ක වර්ධනයක් පෙන්නුම් කරන අතර පසුගිය වර්ෂයට වඩා ක්ෂය වට්නාකම අඩුවීම එයට බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොටගල ප්‍රජා ශක්ති කාර්යාලයේ 2011 වර්ෂයේ අප්‍රේල් දක්වාවූ කාල පරිච්ඡේදයට අදාල වූ රු4,252,500 ක්වූ | මේ සඳහා හැටන් දිසා අධිකරණයේ නඩු පවරා ඇති අතර මෙම නිලධාරීන් | විමර්ෂණ කටයුතු අවසන්වී ඇති බැවින් අදාළ පාර්ශවයන් ගෙන් ඉතිරි |

| | | |
|---|---|---|
| ක්ෂේත්‍ර සම්බන්ධීකරණ දීමනාව දැනට සේවයේ නොමැති ව්‍යාපෘති කළමනාකරුවන් දෙදෙනෙකුගේ පෞද්ගලික බැංකු ගණුමට බැර කර ගැනීම, 2013 ජුලි 24 දින සිදුකරන ලද විශේෂ විමර්ෂණයකින් හෙළිදරව් වීමෙන් පසුව රු.1,050,000 ක් පමණක් අයකරගෙන තිබුණු අතර තවදුරටත් රු.3,702,500 ක් අයකර ගැනීමට නොහැකිව තිබුණි. | දෙදෙනාද පදනමට විරුද්ධව නඩු පවරා ඇති බව. | මුදල්ද අප්‍රමාදව අයකළ යුතුබව |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ 2014 වර්ෂයේ රු.5,840,000 කට කැබ් රථයක් ලබාගෙන තිබුණු අතර, 2015 පෙබරවාරි මාසයේ සිට වාරික මුදල නොගෙවීම මත මෙම රථය මූල්‍ය සමාගම විසින් නැවත අත්පත් කරගෙන තිබුණි. ඒ අනුව ගෙවන ලද රු.1,565,504 පදනමට අලාභයක් ලෙස හඳුනාගත යුතු වුවද, එය අත්තිකාරමක් ලෙස ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පදනමේ අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | කැබ් රථය වසරකට වැඩි කාලයක් පදනම විසින් භාවිතයට ගෙන ඇත. එම කාලයට රථයක් කුලී පදනමට ගනු ලැබුයේ නම් මෙම මුදලට වැඩි මුදලක් ගෙවිමට සිදුවන බැවින් අලාභයක් සිදුව නොමැති බව. | මේ සම්බන්ධයෙන් නිවැරදි තීරණයක් ගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කල යුතුය. |
| (ආ) | රම්බොඩ තොණ්ඩමන් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා පදනම විසින් 2010 වර්ෂයේදී වැඩ අත්තිකාරම් වශයෙන් ලබාදී තිබූ රු.7,544,265 ක් සමාලෝචිත වර්ෂය වනතෙක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම මෙම ඉදිකිරීම් 2013 සැප්තැම්බර් මාසයේ අවසන් කළ යුතු වුවද විගණන දිනයවූ 2022 දෙසැම්බර් 31 දින තෙක්ම අවසන්වී නොතිබීම හේතුවෙන් රු.25,678,995 ක් නොනිම් වැඩ වශයෙන් දක්වා තිබුණි. | ආයතන දෙක සඳහා දැනටමත් රු.මිලියන 3.5 කට ආසන්න ගෙවීමක් කිරීමට ඇත.ඉතිරි වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.වැඩ සටහන් අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන නොමැත. මෙම ආයතන දෙක සම්බන්ධයෙන් නීති උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කරනු ලබන බව. | ඉදිකිරීම් කටයුතු අවසන් කර ගෙවීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කල යුතුය. |